# පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

**(මහජන බැංකුවට අනුබද්ධිතය)**

ෆිච් රේටිංස් ලංකා වෙතින් **A+(lka)** වර්ගීකරණය දිනා ඇත.

## 2020 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

## ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

**සභාපති**
**පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තියට අනුව 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී, සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව.

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** මතය

2020 මාර්තු මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභාලාභ ප්‍රකාශය, විස්තරාත්මක ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයන් ඇතුළත්වන 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පිපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. (සමාගම) සහ පිපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. එහි පරිපාලිත සමාගම්වල (සමූහය) මූල්‍ය ප්‍රකාශන විගණනය, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව මගේ මෙහෙයවීම යටතේ සිදුකරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය කර ගෙන යාම සඳහා, පොදු ව්‍යවහාරය තුළ වරලත් ගණකාධිකාරි ආයතනයක් මා වෙත සහය විය.

මගේ මතය අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2020 මාර්තු මස 31 වන දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වසර සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය සාධාරණ දැක්මක් ලබා දේ.

**1.2** මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මම මාගේ විගණනය පැවැත්වූයෙමි. මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටස තුළ විගණකගේ වගකීම් හි එම ප්‍රමිති යටතේ මාගේ වගකීම තවදුරටත් විස්තර කෙරේ. මම ලබාගත් විගණන සාක්ෂිය මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසු බවට මම විශ්වාස කරමි.

**1.3** මූලික විගණන කරුණු

මූලික විගණන කරුණු වන්නේ පවත්නා කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනය තුළ වඩාත් සැලකිල්ලට ගනු ලැබූ කරුණු වේ. මෙම කරුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමස්තයක් ලෙස සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයේ අන්තර්ගතය තුළ ආමන්ත්‍රණය කරන ලද අතර ඒ සම්බන්ධව මගේ විගණන මතය සකස් කිරීම තුළ මෙම කරුණු සම්බන්ධයෙන් වෙනම මතයක් මම ලබා නොදෙමි.

| ප්‍රධාන විගණන කරුණු | මූලික විගණන කරුණු අපගේ විගණනයෙන් ආමන්ත්‍රණය කරන ලද ආකාරය |
|---|---|
| ණය සහ ලැබීම් සඳහා හානිකරණ දීමනා<br><br>මාගේ විගණනයේදී ණය සහ ලැබීම් සඳහා හානිකරණ දීමනාව මූලික විගණන කරුණක් ලෙස සලකන ලදී. ණය සහ ලැබීම් සමඟ ඒ සම්බන්ධ හානිකරණ දීමනාව සඳහා වාර්තාකළ මුදලේ වැදගත්කම, කළමනාකරණයේ හානිකරණ තක්සේරුව ආශ්‍රිත විෂය සම්බන්ධතාව, අතින් සිදුකළ සංකීර්ණ ගණනය කිරීම සමඟ සම්බන්ධතාව සහ රටේ කොවිඩ්-19 පැතිරීම නිසා කළමනාකරණ ආවරණ තුළ වැඩිවීම, එය මූලික විගණන කරුණක් ලෙස සැලකීම සඳහා මාගේ පදනම් තහවුරු කරන ලදී.<br><br>2020 මාර්තු මස 31 වන දිනට, සමූහයේ මුළු වත්කම්වලින් 834ක් රු. මිලියන 154,135ක් වූ ණය සහ ලැබීම්වලින් සමන්විත විය. (සටහන 225) රු, මිලියන 9,170ක් ශුද්ධ හානිකරණ දීමනාව (සටහන 25).<br><br>මූල්‍ය ප්‍රකාශන වලට සටහන් 25.7 හානිකරණ දීමනාවේ පදනම සහ එය ගණනය කිරීම තුළ කළමනාකරණය විසින් භාවිතා කරන උපකල්පන විස්තතර කෙරේ. | හානිකරණ දීමනාව පිළිබඳ සාධාරණත්වය ඇගයීම සඳහා, මගේ විගණන ක්‍රියාපටිපාටිවල (අනෙකුත් කරුණු අතර) පහත දෑ ඇතුළත් විය:<br><br>• ණය සහ ලැබීම් පිළිබඳ හානිකරණය තක්සේරු කිරීම සම්බන්ධ පාලනයේ සැලසුම් ඵලදායිත්වය මම ඇගයීමට ලක්කල අතර එයට සැලකියයුතු විනිශ්චයන් පිළිබඳ පාලනය, සමාලෝචනය සහ අනුමත කිරීමේ මට්ටම ඇගයීම, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ කළමනාකරණය විසින් හානිකරණයට අදාළව තක්සේරු සහ උපකල්පන ඇතුළත් විය.<br><br>• පාදක වූ ගණනය කිරීම සහ දත්ත පරීක්ෂා කිරීම.<br><br>• ඉහත සඳහන් කරුණුවලට අමතරව, පහත සඳහන් ප්‍රධාන ක්‍රියාපටිපාටි ද ඉටුකරන ලදී.<br><br>හානිකරණය සඳහා තනි තනිව තක්සේරු කළ ණය සහ ලැබීම් පිළිබඳ නියැදියක් සඳහා:<br><br>• හානිකරණයක් සිදු වී තිබේද යන්න තිරණය කිරීම සඳහා කළමනාකරණය විසින් භාවිතා කළ ප්‍රධාන නිර්ණායක මම තක්සේරු කළෙමි.<br><br>• හානිකරණ දර්ශක පවතින අවස්ථාවලදී, නියැදි පදනමත් මත රජයේ සහන |

| | |
|---|---|
| | ක්‍රියාමාර්ග, වට්ටම් අනුපාත සහ දරන ලද ඇපවල වටිනාකම සලකා බලමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ ඇතුළුව කළමනාකරණයේ ඇස්තමේන්තුගත අනාගත අයකිරීම්වල සාධාරණත්වය මම ඇගයීමට ලක්කළෙමි.<br><br>හානිකරණය සඳහා සාමූහිකව තක්සේරු කළ ණය සහ ලැබීම් සඳහා:<br><br>• අදාළ මූලාශ්‍ර ලේඛන තොරතුරු තාක්ෂණ පද්ධතිවල තොරතුරු සහ ගණනය කිරීම් නැවත සිදුකිරීම පිළිබඳ විස්තරවලට එකඟ වෙමින් පාදක තොරතුරු සහ ඒ සම්බන්ධ ගණනය කිරීම්වල සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාව මම පරීක්ෂා කළෙමි.<br><br>• පොදුවේ ලබාගත හැකි දත්ත සහ තොරතුරු මූලාශ්‍ර සමඟ සන්සන්දනය කරමින් කළමනාකරණයේ විවේචනාත්මක ආවරණ තුළ ඔවුන් විසින් භාවිතා කළ සාර්ව ආර්ථික සහ අනෙකුත් සාධක මම සලකා බැලුවෙමි,<br><br>• එමෙන්ම මම ECL ගණනය කිරීම සඳහා CA ශ්‍රී ලංකා විසින් නිකුත්කරන ලද තාවකාලික ප්‍රයෝගික ක්‍රියාමාර්ග පිළිබඳ කළමනාකරණයේ භාවිතය මම ඇගයීමට ලක්කළෙමි.<br><br>• සටහන් 11.25 සහ 59.2 හි දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණවල ප්‍රමාණාත්මකභාවය මම ඇගයීමට ලක්කළෙමි. |
| මූල්‍ය උපකරණ සහ අදාළ අනාවරණයන්ගෙන් ඇනිවන අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ කොවිඩ්-19 පැතිරීමෙන් වියහැකි බලපෑම් කළමනාකරණයේ තක්සේරු කිරිම.<br><br>මූල්‍ය උපකරණ ඇනිවන අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ කොවිඩ්-19 පැතිරිමෙන් වියහැකි බලපෑම් කළමනාකරණයේ තක්සේරු කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනයේ 59.1 වගන්තිය තුළ සම්පූර්ණයෙන් විස්තර කර ඇති පරිදි තක්සේරු දිනය දක්වා ලබාගතහැකි හොඳම තොරතුරු සැලකිල්ලට ගනිමින් අදාළ මූල්‍ය ප්‍රකාශන අනාවරණ සිදුකරන ලබයි.<br><br>ව්‍යාපාරයේ ස්වභාවය සහ වැදගත් කළමනාකරණ විනිශ්චයන් සලකා බලමින් සහ අනාගත සිදුවීම් සහ වාතාවරණ සලකා බලන ඇස්තමේන්තූ සලකා බලමින් එවැනි කළමනාකරණයේ තක්සේරු කිරීම සහ අදාළ අනාවරණ ප්‍රධාන විගණන කරුණු ලෙස මම සලකා බැලුවෙමි. | වෙනත් කරුණු ඇතුළත් මගේ ක්‍රියපටිපාටිවලට පහත දෑ ඇතුළත්ය:<br><br>• මූල්‍ය උපකරණවලින් ඇතිවන අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ කොවිඩ්-19 පැතිරිමෙන් වියහැකි බලපෑම් කළමනාකරණයේ තක්සේරු කිරිම සහ සමූහයේ සංවර්ධනය ආශ්‍රිත ආනාවරණ පිළිබඳ මම අවබෝධයක් ලබා ගනිමි.<br><br>• එමෙන්ම SLFRS හි පරමාර්ථයට අනුව ණය අවදානම් සහ ද්‍රවශීලතා අවදානම පිළිබඳ අවධානය යොමු කරමින් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 59.1, 59.2 සහ 59.3 හි සිදුකළ ගුණාත්මක අනාවරණවල ප්‍රමාණාත්මතාව ද මම ඇගයිමට ලක්කළෙමි.<br><br>• එකි අනාවරණ තහවුරු කරන වැදගත් විනිශ්චයන් සහ ඇස්තමේන්තු සම්බන්ධයෙන්, අදාළ වෙළෙඳපොල තොරතුරු සහ සමූහය විසින් ගනු ලැබූ අභ්‍යන්තර තීරණ පිළිබඳ සැලකිල්ලට ගනිමින් එවැනි ප්‍රධාන උපකල්පන මම ඇගයිමට ලක්කළෙමි. |

**1.4** වෙනත් කරුණු

2019 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණක විසින් විගණනය කරන ලද අතර 2019 ජූනි මස 13 දින එම ප්‍රකාශන සම්බන්ධයෙන් වෙනස් නොකළ මතය ඔහු ප්‍රකාශ කළේය.

**1.5** සමූහයේ **2020** වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

මූල්‍ය ප්‍රකාශන සහ එහි මගේ විගණකගේ වාර්තාව හැර වෙනත් තොරතුරු 2020 සමූහයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරුවලින් සමන්විත වේ. කළමනාකරණය වෙනත් තොරතුරු සඳහා වගකීමට බැඳී ඇත. සමූහයේ 2020 වාර්ෂික වාර්තාව මෙම විගනණකගේ වාර්තාවේ දිනයෙන් පසු දිනයක ලබාදීමට අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ මතයෙන් වෙනත් තොරතුරු ආවරණය නොකරන අතර ඒ පිළිබඳ යම් ආකාරයක සහතික කිරීමේ නිගමනයක් මම ඉදිරිපත් නොකරමි. මෙම මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ මාගේ විගණනය සම්බන්ධයෙන, මාගේ වගකීම වන්නේ ලබාගැනීමට හැකි වූ ඉහත හඳුනාගත් වෙනත් තොරතුරු කියවීම වන අතර, එසේ කරමින්, වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකියයුතු ලෙස අනුරූප නොවන්නේද හෝ විගණනය හෝ වෙනත් ආකාරයකින් මා ලබාගත් දැනුම සැලකියයුතු ලෙස නැවත සඳහන් වී ඇති බව පෙනීයන්නේද යන්න සලකා බැලීමයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ සහ පාලනය සඳහා වගකියන පුද්ගලයින්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටින අතර එවැනි අභ්‍යන්තර පාලනය සඳහා කළමනාකරණ ලෙස තීරණය කිරීම වංචාව හෝ දෝෂ සිදුවිය හැකි වැදගත් වැරදි ප්‍රකාශනවලින් නිදහස්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවීම සඳහා අවශ්‍යය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී, අඛණ්ඩතාවයට අදාළ කරුණු අදාළ පරිදි අනාවරණය කරමින් අඛණ්ඩතාවයක් ලෙස ඉදිරියට ගමන් කිරීම සඳහා සමූහයේ හැකියාව තක්සේරු කිරිම සඳහා සහ කළමනාකරණය සමූහය ඈවර කිරිමට, හෝ මෙහෙයුම් නතර කිරිමට අපේක්ෂා කරන්නේනම් හෝ එසේ කිරිම හැර වෙනත් විකල්පයක් නොමැතිනම් මිස ගිණුම්කරණය පිළිබඳ අඛණ්ඩතා පදනම භාවිතා කිරීමට කළමනාකරණය වගකීමට බැඳී සිටී.

පාලනය සඳහා වගකියන පුද්ගලයින් සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පාලනය කිරීම සඳහා වගකිව යුතුය.

**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **16 (1)** වගන්තියට අනුව, සමූහයට වාර්ෂික සහ කලින් කල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවිම සඳහා සමූහය විසින් එහි සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ සුදුසු පොත් සහ වාර්තා පවත්වා ගැනිම අවශ්‍ය වේ.

**1.7** මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම

මගේ පර්මාර්ථය වන්නේ සමස්තයක් ලෙස වංචා හෝ දෝෂ හේතුකොට ගෙන මූල්‍ය ප්‍රකාශන වැදගත් වැරදි ප්‍රකාශයන්ගෙන් නිදහස්ද යන්න පිළිබඳ සාධාරණ සහතිකය ලබාගැනීම සහ මගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරිමයි. සාධාරණ සහතිකය ඉහළ මට්ටමේ සහතිකයක් වුවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනයකින් වැදගත් වැරදි ප්‍රකාශයක් එහි පැවතියද සෑම අවස්ථාවකදීම එය සොයා ගන්නා බවට වගවීමක් නොමැත. වැරදි ප්‍රකාශ වංචාව හෝ දෝෂය

තුළින් ඇතිවිය හැකි අතර තනි තනිව හෝ එකතුව මෙම මූල්‍ය ප්‍රකාශනවල පදනම මත ගනු ලබන ආර්ථික තීරණවලට බලපෑම් කිරිමට ඉන් සාධාරණව අපේක්ෂා කරන්නේනම් වැදගත් ලෙස සලකනු ලබයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විගණනයක කොටසක් ලෙස මම වෘත්තීය විනිශ්චය ක්‍රියාවේ යොදවන අතර විගණනය පුරා වෘත්තීය විචක්ෂණභාවය පවත්වා ගනිමි. එමෙන්ම මම,

- වංචාව හෝ දෝෂ හෝ සැලැස්ම හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශන පිළිබඳ අවදානම් හඳුනාගෙන තක්සේරු කරන අතර එවැනි අවදානම්වලට ප්‍රතිචාරාත්මක විගණන ක්‍රියාපටිපාටි ඉටුකරමින් මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසුවන විගණන සාක්ෂිය ලබා ගනිමු. වංචාවෙන් ඇතිවන ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශනයක් සොයා නොගැනීමේ අවදානම වංචාව කුමන්ත්‍රණය, ව්‍යාජ ලේඛන සෑදීම, සිතාමතා ඉවත්කිරීම්, ව්‍යාජ නියෝජන, හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරිම හා සම්බන්ධවන බැවින් දෝෂයකින් ඇතිවන දෙයකට වඩා විශාලය. සමූහයේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරිමේ අරමුණ සඳහා හැර අවස්ථාවන්ට සුදුසුවන විගණන ක්‍රියාපටිපාටිය සැලසුම් කිරිම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමු.

- කළමනාකරණය විසින් භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ ඔවුන් විසින් සිදුකරක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ අනාවරණවල සාධාරණත්වය අගය කරමි.

- ගිණුම්කරණය පිළිබඳ අඛණ්ඩතා පදනම සම්බන්ධ කළමනාකරණයේ භාවිතයේ යෝග්‍යතාව සහ ලබාගත් විගණන සාක්ෂිය මත පදනම් වී, අඛණ්ඩතාවක් ලෙස ඉදිරියට යාම පිළිබඳ සමාගමේ හැකියාව සම්බන්ධව වැදගත් සැකයක් ඇතිකළ හැකි සිදුවීම් සහ තත්ත්වයන් සම්බන්ධයෙන් වැදගත් අවිනිශ්චිතාවක් පවතීද යන්න නිශ්චය කරමි. වැදගත් අවිනිශ්චිතාවක් පවතින බවට මම නිශ්චය කරන්නේනම් මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ අනාවරණයන්ට මගේ විගණක වාර්තාව පිළිබඳ අවධානය යොමු කිරිම අවශ්‍ය වන අතර, එවැනි අනාවරණ ප්‍රමාණවත් නොවන්නේනම් මගේ මතය වෙනස් කිරිමට අවශ්‍ය වේ. මගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂිය මත මාගේ විගණන පදනම් වේ. කෙසේවෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් අඛණ්ඩ පදනමක් මත සමූහය ඉදිරියට යාම නතර කිරිමට හේතු විය හැකිය.

- සමස්ත ඉදිරිපත් කිරීම, අනාවරණ ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගන්නා ආකාරයකින් පාදක වූ ගනුදෙනු හා සිදුවීම් නියෝජනය කරන්නේද යන්න ඇගයීමට ලක් කළෙමි.

අනෙකුත් කරුණු අතර මගේ විගණනය තුළ මම හඳුනාගත් අභ්‍යන්තර පාලනය තුළ යම් වැදගත් අඩුපාඩු ඇතුළුව වැදගත් විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් වගකියන පුද්ගලයින් සමඟ මම අදහස් හුවමාරු කර ගනිමි.

**2.** අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2018** අංක **19** දරන ජාතික විගණන පනත සහ **2007** අංක **07** දරන සමාගම් පනත තුළ පහත අවශ්‍යතා සඳහා විශේෂ විධිවිධාන ඇතුළත්ය.

- විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම මම ලබාගෙන ඇති අතර, මගේ පරීක්ෂණයෙන් පෙන්නුම්වනතාක් දුරට, 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතා පරිදි සුදුසු ගිණුම්කරණ වාර්තා සමාගම විසින් තබා ගෙන ඇත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (111) වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශ පූර්වාසන්න වසර සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (17) වගන්නියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශවල පෙර වසරේ මා විසින් සිදුකළ සියලුම නිර්දේශ ඇතුළත් වේ.

ඉටුකළ ක්‍රියාපටිපාටිය සහ ලබාගත් සාක්ෂිය මත පදනම් වීම පහත දැ සඳහන් කිරීමට තරම් කිසිවක් මගේ අවධානයට යොමු නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතා පරිදි සාමාන්‍ය ව්‍යාපාර රටාවෙන් බැහැරව සමාගම විසින් ඇතුළත් වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සමාගමේ පාලන මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙක්ට ඍජු හෝ වක්‍ර බැඳීමක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතා පරිදි සමාගමේ පාලන මණ්ඩලය විසින් නිකුත්කළ අදාළ ලිඛිත නීතියකට, පොදු සහ විශේෂ උපදෙස්වලට සමාගම අනුකූල වී නොමැති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතා පරිදි සමාගමේ බලතල, කාර්යයන් සහ රාජකාරි සමාගම ඉටු කර නොමැති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතා පරිදි අදාළ නීතිය සමඟ අනුකූලව කාල රාමුවක් තුළ ආර්ථිකමය, කාර්යක්ෂමව සහ ඵලදායීව සමාගම ප්‍රසම්පාදනය සහ භාවිතා කර නොමැති බව.

ඩබ්ලිව්, පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

# ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය

මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා

| | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | **2020** | 2019 | වෙනස | **2020** | 2019 | වෙනස |
| | **රු. '000** | රු. '000 | % | **රු. '000** | රු. '000 | % |
| ආදායම | **33,599,314** | 32,735,639 | 2.64 | **40,054,830** | 38,356,205 | 4.43 |
| පොලී ආදායම | **31,459,108** | 30,836,300 | 2.02 | **33,282,879** | 32,234,340 | 3.25 |
| අඩු කළා: පොලී වියදම | **15,786,586** | 15,646,099 | 0.90 | **16,110,935** | 15,891,298 | 1.38 |
| ශුද්ධ පොලී ආදායම | **15,672,522** | 15,190,201 | 3.18 | **17,171,944** | 16,343,042 | 5.07 |
| වාරික වලින් ශුද්ධ ඉපැයීම | **-** | - | - | **5,202,030** | 4,728,573 | 10.01 |
| ගාස්තු හා කොමිස් ආදායම් | **1,694,014** | 1,508,952 | 12.26 | **1,165,632** | 1,004,297 | 16.06 |
| ගනුදෙනු සඳහා රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්වල සිදුවූ ශුද්ධ ලාභ/ අලාභ | **11,017** | (27,887) | (139.51) | **19,586** | (44,351) | (144.16) |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | **435,175** | 418,274 | 4.04 | **384,703** | 433,346 | (11.22) |
| මුළු මෙහෙයුම් ආදායම් | **17,812,728** | 17,089,540 | 4.23 | **23,943,895** | 22,464,907 | 6.58 |
| අඩු කළා : ණය සඳහා අපහානය සහ අනෙකුත් අලාභ | **4,646,683** | 1,586,506 | 192.89 | **4,901,902** | 1,708,203 | 186.96 |
| ආශ්‍රිත ආයෝජන සඳහා අපහානය | **-** | 348,794 | (100.00) | **-** | 152,572 | (100.00) |
| භාවිත කිරීමේ අයිතිය ඇති වත්කම් සඳහා අපහානය | **36,965** | - | 100.00 | **36,965** | - | 100.00 |
| කීර්තිනාමය සඳහා අපහානය | **68,145** | 19,580 | 248.03 | **68,145** | 19,580 | 248.03 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම් | **13,060,935** | 15,134,660 | (13.70) | **18,936,883** | 20,584,552 | (8.00) |
| අඩු කළා : වියදම් | | | | | | |
| සේවක වියදම් | **3,701,385** | 3,438,167 | 7.66 | **4,561,026** | 4,166,618 | 9.47 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ක්ෂය වීම සහ ක්‍රමක්ෂය | **717,021** | 179,607 | 299.22 | **635,998** | 302,360 | 110.34 |
| ප්‍රතිලාභ හිමිකම් සහ ප්‍රාරක්ෂණ වියදම් | **-** | - | - | **3,441,937** | 3,328,705 | 3.40 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | **2,088,244** | 2,844,419 | (26.58) | **2,565,073** | 3,048,420 | (15.86) |
| මුළු මෙහෙයුම් වියදම් | **6,506,650** | 6,462,193 | 0.69 | **11,204,034** | 10,846,103 | 3.30 |
| මූල්‍ය සේවාවන් සඳහා බදු පෙර මෙහෙයුම් ලාභය | **6,554,285** | 8,672,467 | (24.42) | **7,732,849** | 9,738,449 | (20.59) |
| අඩු කලා : මූල්‍ය සේවා මත බදු | **2,002,460** | 2,087,210 | (4.06) | **2,030,532** | 2,117,910 | (4.13) |
| මූල්‍ය සේවා මත බදු පසු මෙහෙයුම් ලාභය | **4,551,825** | 6,585,257 | (30.88) | **5,702,317** | 7,620,539 | (25.17) |
| ආශ්‍රිතයින් හි අලාභ කොටස (බදු පසු) | **-** | - | - | **-** | (33,234) | 100.00 |
| ආදායම් බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය | **4,551,825** | 6,585,257 | (30.88) | **5,702,317** | 7,587,305 | (24.84) |
| අඩු කලා : ආදායම් බදු වියදම් | **1,609,317** | 2,169,136 | (25.81) | **2,110,568** | 2,576,037 | (18.07) |
| වර්ෂය සඳහා ලාභය | **2,942,508** | 4,416,121 | (33.37) | **3,591,749** | 5,011,268 | (28.33) |
| ලාභය බෙදී යන ආකාරය | | | | | | |
| සමාගමේ කොටස් හිමිකරුවන්ට | **2,942,508** | 4,416,121 | (33.37) | **3,408,670** | 4,813,578 | (29.19) |
| පාලනයට යටත් නොවන හිමිකම් | **-** | - | - | **183,079** | 197,690 | (7.39) |
| වර්ෂය සඳහා ලාභය | **2,942,508** | 4,416,121 | (33.37) | **3,591,749** | 5,011,268 | (28.33) |
| සාමාන්‍ය කොටසක ඉපැයීම (රු.) | **1.83** | 2.80 | (34.64) | **2.11** | 3.05 | (30.82) |
| සාමාන්‍ය කොටසක ලාභාංශය (රු.) | **1.20** | 1.25 | (4.00) | | | |

## තෝරාගත් කාර්යසාධන දර්ශකයන්

| | සමාගම | |
|---|---|---|
| | **2020** | **2019** |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය** | | |
| **පළමු පෙළ ප්‍රාග්ධනය - (රු. දහස්)** | **29,269,430** | 26,517,785 |
| **මුළු ප්‍රාග්ධන පදනම - (රු. දහස්)** | **30,941,745** | 28,065,758 |
| **පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය (අවමය 7%) %** | **15.12** | 14.36 |
| **මුළු ප්‍රාග්ධන අනුපාතය (අවමය 11%) %** | **15.99** | 15.20 |
| **ප්‍රාග්ධන අරමුදල් අනුපාතය මුළු තැන්පතු වගකීම් වල ප්‍රතිශතයක් ලෙස (අවමය 10%)** | **28.35** | 32.37 |
| **වත්කම්වල ගුණාත්මකභාවය** | | |
| **දළ අක්‍රිය ණය පහසුකම් - (රු. දහස්)** | **14,416,156** | 7,213,587 |
| **දළ අක්‍රිය ණය පහසුකම් අනුපාතය (%)** | **9.13** | 4.58 |
| **ශුද්ධ අක්‍රිය ණය පහසුකම් අනුපාතය (%)** | **2.55** | 0.77 |
| **ද්‍රවශීලතාවය (රු. දහස්)** | | |
| **අවශ්‍ය අවම ද්‍රවශීල වත්කම්** | **7,656,046** | 12,113,224 |
| **පවත්නා ද්‍රවශීල වත්කම්** | **14,459,377** | 13,192,697 |

| | | |
|---|---|---|
| අවශ්‍ය අවම රජයේ සුරැකුම්පත් | **6,622,410** | 8,012,871 |
| පවත්නා රජයේ සුරැකුම්පත් | **9,240,656** | 8,290,205 |
| **ලාභදායිත්වය (%)** | | |
| පොලී ආන්තිකය | **9.68%** | 9.70% |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (බදු වලට පෙර) | **2.64%** | 3.95% |
| සාමාන්‍ය හිමිකම් මත ලාභ | **10.00%** | 15.88% |
| **නාමමාත්‍රික තොරතුරු** | | |
| සේවක සංඛ්‍යාව | **2,401** | 2,329 |
| ශාඛා සංඛ්‍යාව | **103** | 103 |
| සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව | **101** | 101 |
| උකස් මධ්‍යස්ථාන සංඛ්‍යාව | **-** | - |

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | **2020** | 2019 | වෙනස | **2020** | 2019 | වෙනස |
| | **රු. '000** | රු. '000 | % | **රු. '000** | රු. '000 | % |
| වර්ෂය සඳහා ලාභය | **2,942,508** | 4,416,121 | (33.37) | **3,591,749** | 5,011,268 | (28.33) |
| **අනෙකුත් විස්තීරණ ආදායම් / (වියදම්)** | | | | | | |
| *ඉදිරි වර්ෂ වල ලාභ හෝ අලාභවලට නැවත වර්ග කල හැකි අයිතම (ශුද්ධ බදු)* | | | | | | |
| විදෙස් පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන පරිවර්තනය කිරීමෙන් ඇති වූ ශුද්ධ ලාභ/ අලාභ | **-** | - | - | **139,129** | 259,151 | (46.31) |
| ඉදිරි වර්ෂවල ලාභ හෝ අලාභ සඳහා නැවත වර්ගීකරණය කළ යුතු ශුද්ධ අයිතම | **-** | - | - | **139,129** | 259,151 | (46.31) |
| ඉදිරි කාලච්ඡේදවල ලාභ හෝ අලාභවලට නැවත වර්ගීකරණය නොකල යුතු අයිතම (ශුද්ධ බදු): | | | | | | |
| අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම් මත ශුද්ධ ක්‍රියාකාරී ලාභ/ (අලාභ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයු ගණන ලාභ සහ අලාභ | **172** | (17,909) | (100.96) | **1,225** | (20,872) | (105.87) |
| ඉහත දෑ සඳහා විලම්භිත බදු වල බලපෑම | **(49)** | 5,670 | (100.86) | **(91)** | 14,028 | (100.65) |
| මූල්‍ය වත්කම් - විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින් සාධාරණ අගයට අගය කරන උපකරණ | | | | | | |
| නැවත මැනීමෙන් ලාභ/ (අලාභ) | **(49,372)** | (99,611) | 50.44 | **(61,300)** | (100,290) | 38.88 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ඉදිරි කාලච්ඡේදවල ලාභ හෝ අලාභවලට නැවත වර්ග කල නොහැකි ශුද්ධ වෙනත් විස්තීරණ ආදායම් :** | **(49,249)** | (111,850) | 55.97 | **(60,166)** | (107,134) | 43.84 |
| **වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායම්, බදු ගෙවූ පසු** | **(49,249)** | (111,850) | 55.97 | **78,963** | 152,017 | (48.06) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ අදායම** | **2,893,259** | 4,304,271 | (32.78) | **3,670,712** | 5,163,285 | (28.91) |
| **බෙදී යන අයුරු :** | | | | | | |
| **සමාගමේ කොටස් හිමියන්** | **(49,249)** | (111,850) | 55.97 | **82,278** | 152,757 | (46.14) |
| **පාලනය කළ නොහැකි පොළිය** | **-** | - | - | **(3,315)** | (740) | 347.97 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු)** | **(49,249)** | (111,850) | 55.97 | **78,963** | 152,017 | (48.06) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **2,893,259** | 4,304,271 | (32.78) | **3,670,712** | 5,163,285 | (28.91) |

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | **2020 Rs. '000** | 2019 Rs. '000 | වෙනස % | **2020 Rs. '000** | 2019 Rs. '000 | වෙනස % |
| **වත්කම්** | | | | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | **7,164,139** | 3,294,055 | 117.49 | **7,693,032** | 4,310,595 | 78.47 |
| බැංකු හා මූල්‍ය ආයතන සමග ඇති ශේෂය | **3,207,440** | 3,404,533 | (5.79) | **6,661,407** | 7,375,423 | (9.68) |
| මූල්‍ය වත්කම් - ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගය අනුව | **1,031,719** | 23,190 | 4,348.98 | **1,198,592** | 72,386 | 1,555.83 |
| ණය සහ ලැබිය යුතු - ක්‍රමක්ෂය පිරිවැයට | **147,747,511** | 151,707,902 | (2.61) | **154,134,934** | 156,955,837 | (1.80) |
| රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු | **-** | - | - | **1,194,933** | 885,395 | 34.96 |
| මූල්‍ය වත්කම් - විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින් සාධාරණ අගය අනුව | **324,381** | 125,651 | 158.16 | **1,455,702** | 125,651 | 1,058.53 |
| ණය උපකරණ - ක්‍රමක්ෂය පිරිවැයට | **4,106,963** | 8,002,625 | (48.68) | **4,813,439** | 9,091,945 | (47.06) |
| පාලිත සමාගම් වල ඇති ආයෝජනය | **3,213,788** | 3,213,788 | - | **-** | - | - |
| ආශ්‍රිත සමාගම් වල ඇති ආයෝජනය | **-** | 237,633 | (100.00) | **-** | 237,633 | (100.00) |
| දේපල ආයෝජන | **-** | - | - | **1,131,652** | 1,131,596 | 0.00 |
| දේපල පිරියත හා උපකරණ | **1,143,929** | 1,098,286 | 4.16 | **3,998,370** | 4,017,301 | (0.47) |
| කීර්ති නාමය සහ අස්පෘෂ්‍ය වත්කම් | **257,581** | 324,905 | (20.72) | **368,574** | 432,340 | (14.75) |
| භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් | **1,939,450** | 84,065 | 2,207.08 | **1,639,482** | 84,065 | 1,850.26 |
| විලම්භිත බදු වත්කම් | **376,291** | - | 100.00 | **471,841** | 47,584 | 891.60 |
| අනෙකුත් වත්කම් | **1,147,001** | 1,024,644 | 11.94 | **1,235,329** | 1,164,884 | 6.05 |
| මුළු වත්කම් | **171,660,193** | 172,541,277 | (0.51) | **185,997,287** | 185,932,635 | 0.03 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වගකීම් | | | | | | |
| බැංකු සඳහා ගෙවිය යුතු | **7,938,185** | 27,273,933 | (70.89) | **10,978,046** | 30,475,326 | (63.98) |
| ගණුදෙනුකරුවන් සඳහා ගෙවිය යුතු | **106,701,027** | 88,368,656 | 20.75 | **107,685,592** | 88,923,196 | 21.10 |
| නිකුත් කළ ණය උපකරණ | **18,479,260** | 21,275,031 | (13.14) | **18,338,039** | 21,134,040 | (13.23) |
| අනෙකුත් මූල්‍ය වගකීම් | **3,014,117** | 2,480,377 | 21.52 | **2,829,708** | 2,464,936 | 14.80 |
| රක්ෂණ වගකීම් සහ ප්‍රතිරක්ෂණ ගෙවීම් | **-** | - | - | **5,065,220** | 4,880,873 | 3.78 |
| මෙහෙයුම් කල්බදු වගකීම් | **1,909,098** | - | 100.00 | **1,594,245** | - | 100.00 |
| ප්‍රවර්තන බදු වගකීම් | **1,803,309** | 2,238,257 | (19.43) | **2,077,418** | 2,323,647 | (10.60) |
| විලම්භිත බදු වගකීම් | **-** | 837,179 | (100.00) | **418,132** | 1,141,973 | (63.39) |
| අනෙකුත් වගකීම් | **1,568,565** | 1,464,489 | 7.11 | **1,700,685** | 1,606,686 | 5.85 |
| මුළු වගකීම් | **141,413,561** | 143,937,922 | (1.75) | **150,687,085** | 152,950,677 | (1.48) |
| හිමිකම් | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | **13,915,414** | 13,236,073 | 5.13 | **13,915,414** | 13,236,073 | 5.13 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | **2,205,344** | 2,058,219 | 7.15 | **2,235,077** | 2,070,667 | 7.94 |
| රඳවාගත් ඉපැයුම් | **14,227,988** | 13,361,805 | 6.48 | **16,517,824** | 15,198,424 | 8.68 |
| අනෙකුත් සංචිත | **(102,114)** | (52,742) | 93.61 | **285,103** | 207,274 | 37.55 |
| මුළු කොටස්කරුවන්ගේ හිමිකම | **30,246,632** | 28,603,355 | 5.75 | **32,953,418** | 30,712,438 | 7.30 |
| පාලනය කළ නොහැකි වගකීම | **-** | - | - | **2,356,784** | 2,269,520 | 3.85 |
| මුළු හිමිකම් | **30,246,632** | 28,603,355 | 5.75 | **35,310,202** | 32,981,958 | 7.06 |
| මුළු වගකීම් හා හිමිකම් | **171,660,193** | 172,541,277 | (0.51) | **185,997,287** | 185,932,635 | 0.03 |
| අසම්භාව්‍ය වගකීම හා බැඳීම් | **5,316,892** | 7,775,864 | (31.62) | **5,350,615** | 7,788,708 | (31.30) |
| සාමාන්‍ය කොටසක ශුද්ධ වත්කම් අගය (රු.) | **18.58** | 18.10 | 2.64 | **20.25** | 19.44 | 4.14 |

මෙම මුලා ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධාන වලට අනුකූලව සකසා ඇති බව අපි විසින් සහතික කරමු.

(අ.ක.ල)
ඔමල් සුමනසිරි
ප්‍රධාන කළමනාකරු - මුලා

(අ.ක.ල)
ඒ.එස්.ඊබ්‍රහිම්
ප්‍රධාන විධායක නිලධාරි

මෙම මුලා ප්‍රකාශනය සකස් කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලද්දේ

(අ.ක.ල)
සුජීව රාජපක්ෂ
සභාපති

(අ.ක.ල)
රොහාන් පතිරගේ
අධ්‍යක්ෂක

**2020 ජූලි 08**
කොළඹ දී ය